

පොළොන්නරුව දිස්ත්‍රික්කයේ පිහිටි සෝමාවතී පුදබිම පසුගිය දා ගැලූ ගංවතුරට යට වී ඇති අයුරු

# එකතැන පල්වීම!

1 වෙනි පිටුවෙන් ........

## ජනතාවගේ කැපකිරීම් සහ පරිත්‍යාග

කුරිරු යුද්ධය අවසන්ව වසර දෙකක් සම්පූර්ණ වූයේය. සුනාමි ව්‍යසනය විත් අප දිවයිනේ ගොඩබිම විනාශකරමින්, ජීවිත හා දේපළ බිළිගනිමින් සිදුකළ, ඉතිහාසයේ පෙර නොවූ විරූ ඒ මහා නස්පැත්තියෙන් අප ගොඩ ආවේ ලොව දරුණුම ත්‍රස්තවාදී කල්ලියක් හා දරුණු යුද්ධයක යෙදෙන අතර වාරයේමය. ඒ සමගම ඒ දරුණු ත්‍රස්ත කල්ලිය සාර්ථක ලෙස නැති හංගකරන්නටද අපි සමත් වූයෙමු. බටහිර රටවල් ඇතුළු අපේ නොයෙක් දේශපාලන සතුරන් රජයේ ක්‍රියා පිළිවෙත වලක්වන්නට කොටි ත්‍රස්තයින්ට පක්ෂව යෙදූ නොයෙක් උප්පර වැට්ටිද, අසත්‍ය ප්‍රචාරද අපට හොඳින් මතකය.

රට තුළද, විපක්ෂය ඇතුළු විවිධ මත දරණ දේශපාලන වාදීන්ද, රාජ්‍ය නොවන සංස්ථාවලට කත් අදින මාධ්‍යකාරයින්ද, ඇතුළු ප්‍රතිගාමී කොටස් රජයට, හමුදා සේනාංකයන්ට හා ත්‍රස්තවාදීන් මර්දනය කරනවාට එරෙහිව ගෙන ගිය අනේක අසත්‍ය හා මඩ ප්‍රචාරයන් හමුවේ ඒවා තෘණ සතේකට නොතකමින්, රජය හා හමුදාවන් විශ්වාසකරමින්, නැග එන ජීවන වියදම, බඩුමිළ, ඩෙංගු, මැලේරියා රෝග, ගංවතුර, මේ ආදී බාධක කිසිවක් ගණනකට නොගෙන, පටි තදකරගන්නට කී විට පටි තදකරගෙන, නොසෙල්වී රජය හා හමුදා සමග ස්ථිරව සිටියෝ රටේ බහුතරය වූ සාමාන්‍ය දිළිඳු ජනතාවෝය. රජය ඒ බව සිත්හි දරාගත යුතු ය. ඒ බව අමතක නොකළ යුතු ය. ඒ මිනිසුන් එසේ ක්‍රියා නොකරන්නට යුද්ධයක් දිනන්නට මේ සම්මජාතියේදී හැකිවන්නේ නැත. රටක ජනතාවගේ පරිත්‍යාගයෙන් තොරව යුද්ධ දිනා ඇත්තේ කොයි ලෝකයේද? ශ්‍රීලංකාවේ සාමාන්‍ය ජනයා රටටද, හමුදාවටද, රජයටද ආදරයෙන් යුතුව ඒ පරිත්‍යාගය පෙරදැරි සහාය නොදෙන්නට අද ලංකාවේ ඊළම බිහිවී තිබෙනු දකින්නට පුළුවන්කම තිබුණි. ඒ නිසා ඒ මිනිසුන්ගේ හඬට කන් දෙන්නට, ඔවුන්ගේ ප්‍රශ්න ගැන වහා සොයා බලා කඩිනම් පියවරවල් ගන්නට මේ රජයට වගකීමක් ඇත. ඒ වගකීමෙන් බේරෙන්නට මැති ඇමතිවරුන්ට බැරිය. ඒ වගකීම මත රජය කටයුතු කළ යුතු ය.

එසේ නොකළ හොත් මේ **ජනතා මිතුරන්** වැඩිකල් නොගොස් **ජනතා සතුරන්** බවට පත්වනු නොඅනුමානය. රජය රටක ජනතාව නොතකන්නේ නම් ඒ ජනතාව රජය සමග ඉන්නට සූදානම් නැත. එවිට ඔවුන් වෙනතක් බලනවා ඇත. දැනටම මේ රජයේ මැති ඇමතිවරු කරනා දූෂණ ක්‍රියා හා නැති නාස්තියද, ජීවන වියදම ගැන නොතැකීමද ආදී රජයේ දුර්වලතා රනිල් වික්‍රමසිංහ ප්‍රමුඛ විපක්ෂය ප්‍රයෝජනයට ගනිමින් ජනතාව අමතන හැටි, උසිගන්වන හැටි අපට පෙනේ. මේ ජනතාව යම් දිනක රජයට පිටුපෑව හොත් එදාට ජනතාවට වැරදි කිවයුතු නැත. සාමාන්‍ය මිනිසාට ද ඉවසීමේ සීමාවක් ඇත. බලයේ සිටින අය තම ඉදිරි කාලය ගැන ප්‍රවේසම් විය යුතුය.

## පළාත්පාලන මැතිවරණ

මා ලංකාවේ මේ දිනවල දකින ඉතාම කණගාටුදායක දෙය නම් දැනට ගංවතුර ව්‍යසනයෙන් ලක්ෂ සංඛ්‍යාත ජනතාවක් අසරණව උන් හිටි තැන් හා දේපළ අහිමිව අනාථව, දුකට පත්ව සිටිද්දී, අසරණ ඔවුන් ගැන බලනු වෙනුවට රජයද, විපක්ෂයද ඇතුළු සියළු පොලිටික්කෝ පළාත්පාලන මැතිවරණ කටයුතු පසුපස ඉවක් බවක් නැතිව දුව යන හැටිය. මේ වගේ අවදානම් දුක්ඛිත වාතාවරණයක් තුළ මැතිවරණ පැවැත්වීම අයෝග්‍යයයි මේ දේශපාලන හිස් මොළවලට කතාකර කියන්නට තරම් මොළේ ඇති කිසිවෙකු අද අපේ රටේ නැත. බලයට එන්නට වලිකන මේ අය තමන් නියෝජනය කරන්නට බලාපොරොත්තු වන මිනිසුන්ම දුකට වැටී සිටිනවා නොවේදැයි හිතන්නේ නැත. එහෙත් ඡන්ද රැස්වීම්වල ස්ටේජ් මුදුණේ සිට ගිරිය කඩාගෙන කෑගහන්නේ මේ ජනතාවට සේවය කරන බවටය. ලංකාවේ දේශපාලකයා යනු බලයට එනතෙක් පොරොන්දු දෙන්නෙකි. ඔවුන් කවුරුදැයි හඳුනාගත හැක්කේ ඡන්දයෙන් පසුවය. දැන් මේ ව්‍යසන සියල්ල අස්සේ දැත් ඔසවා ආචාර කරගෙන සිටින, කට කන ළඟට ඉරෙන තරම් පළල් හිනාවක් දාගත් මුහුණු, තාප්පවල, බිත්තිවල, බෝක්කුවල දැන් සිටම අලවන්නට පටන්ගෙන ඇත. දුප්පත් අසරණයා මෙහිදී හිතන්නේ “ අහෝ ! මේ සර්කස් එක ඉවරවෙන්නේ කවදාද ? ” යන්නය.

## එක තැන පල්වීම

රටේ බොහෝ දේ පටන්ගෙන ඇතත් ඒ කිසිවක් ඉදිරියට යන බවක් පෙනෙන්ට නැත. ආරම්භ කළ දේවල් එක තැන පල්වෙන සෙයක් දැනට පෙනේ. රජයේ මැති ඇමතිවරුන්ගේ කිසි පිළිවෙලක් නැති, එසේම කිසිම ක්‍රියාවකට කාගේවත් වගකීමක් නැති මේ තත්වය ඉදිරියට තවත් නරක අතට හැරුණොත් වචනයෙන් කියන සුබ අනාගතයක් හා ඉදිරිදැක්මක් හීනෙන්වත් දකින්නට හැකිවේයයි සිතනු නොහැකිය.

## ජනපති වගකීම

කලින් අකර්මණ්‍යව සිටි හමුදාවකට විශ්වාසයද නායකත්වයද අවශ්‍ය ආම්පන්නද සම්පාදනය කරමින් ජනාධිපතිතුමා ගත් අගේ කළයුතු පියවරවල් නිසාම තිස්වසරක ශාපලත් කුරිරු ත්‍රස්තවාදී යුද්ධය අවසන් කළ හැකි විය. අද අපේ රට සැනසුම් සුසුම් හෙලන්නේ ඒ නිසාය. ඒ ගැන අප කවුරුත් ප්‍රශංසාත්මකව දැනුදු කල්පනා කරන්නෙමු. එය සුළු පටු දෙයක් නොවේ.ඒ ආකාරයෙන් මේ දැන් සිටින මැති ඇමතිවරුන් ලවා රටට ප්‍රයෝජනවත් දේවල් කරවන්නට එතුමාට හැකිනම් එය නිසැකවම ශ්‍රීලංකාව සැබෑ සුබ අනාගතයක් වෙත රැගෙනයන මගක් වනු ඇත.

# දළදා මාළිගා ප්‍රහාරය සිහිකොට දානමය පිංකමක්!



එදා කොටි ත්‍රස්තවාදින් එල්ල කළ බෝම්බයෙන් දළදා මාළිගාවේ ඉදිරිපස විනාශව ගොස් තිබෙන හැටි එදා උදේ ගත් මෙම ඡායාරූපයෙන් පෙනේ. මාළිගාවේ ඇතුළත සමහර තැන් වලට හා දේවාල වලටද හානි සිදුවිය

**කො**ටි ත්‍රස්තවාදීහු 1998 ජනවාරි 25 වන දින මහනුවර දළදා මාළිගාවට බෝම්බ ප්‍රහාරයක් එල්ල කොට දන්ත ධාතු මන්දිරයට අලාභ හානි කළෝය. එහිදී අත දරුවෙකුද සමග සැදැහැවතුන් 8 දෙනෙකු මිය ගිය අතර 25 ක් තුවාල ලැබූහ. එම ත්‍රස්ත ක්‍රියාව පමණක් නොව වසර 30 ක්පුරා නොයෙක් නොයෙක් විට එම උවදුරෙන් විය ගිය හමුදා සේනාංකවල අය භික්ෂු භික්ෂුණී වහන්සේලා සහ මහජනතාව ආදී සියළුම දෙනා සිහිපත් කොට වාර්ෂිකව කෙරෙන පිං පැමිණවීමක් වසර ගණනක් තිස්සේ ලන්ඩනයේ සිදු කෙරේ.

මෙම පෙබරවාරි 6 වන දින විශාල පිරිසකගේ සහභාගිත්වයෙන් ලන්ඩන් විහාරයේ දී දානමය පිංකමක් සිදුකර පිංපමුණුවන ලදී. තවත් දේශප්‍රේමී හිතවත් අයද එක්කරගෙන මෙම අගනා කාර්යයට මූලික වූයේ ලන්ඩනයේ වෙසෙන කරුණා බස්නායක මහතා ය.

# මුබාරක් අයින්වේදෝ? නොවේදෝ?

## He will go..... He will not go...



**Hosni Sayyid Mubarak**
**The President of Egypt**



Thousands of people protest in Tahrir Square in Cairo, demanding President Mubarak's resignation from leadership. Rallies against him continued, while the army was reportedly leaving the protesters alone and guarding only cites of national interest. Mubarak is defiant. He sees no reason to leave and says if he did so Egypt would fall into unfathomable chaos and jeopardy.

ඊජිප්තුවේ ජනාධිපති හොස්නි මුබාරක් අද විශාලතම අර්බුදයකට මුහුණ පා සිටී. ඔහුට ජනාධිපතිධූරයෙන් ඉවත්වී යන්නැයි උද්ඝෝෂණය කරමින් කයිරෝ නගරයේ තාහිර් චතුරශ්‍රයට දහස් සංඛ්‍යාත ජනකායක් එක්ව සිටිති. සති දෙකකටත් වැඩි කාලයක සිට මේ දක්වා ම එම විරෝධතා උද්ඝෝෂණ නොකඩවා පවතී. එහෙත් මුබාරක් යන පාටක් නැත. මුබාරක් කියන්නේ තමාට ජනපතිකම දැන් එපාවී ඇති බවයි. එහෙත් යන බවක් නම් නොකියයි. ඒ වෙනුවට කියන්නේ ජනතාවගේ ඉල්ලීමට කන්දී ලබන ජනපතිවරණයට තමා ඉදිරිපත් නොවන බවයි. උද්ඝෝෂකයින්ට ඒ මදිය. “ මුබාරක් උඹ දැන් පලයන්....!” ඔව්හු එකා මෙන් හඬ නගති. ජනාධිපතිවරයාට පක්ෂ පිරිස් හා විරෝධය පාන පිරිස් අතරේ ගැටුම් හටගෙන ඇත. සෙනග හසුරුවන ආරක්ෂක අංශයේ භටයින්ද මුලින් රජයේ පැත්ත ගෙන උද්ඝෝෂකයින්ට තලාපෙලා හිරිහැර කළත් දැන් ඔව්හු එසේ නොකර නගරයේ වැදගත් ජාතික ස්ථාන මුරකිරීමේ පමණක් යෙදී සිටිති.

1928 මැයි මස 4 වෙනි දින උපත ලැබූ මොහොමඩ් හොස්නි සෙයිඩ් මුබාරක්, ඊජිප්තු සමූහාණ්ඩුවේ හතරවැනි සහ වත්මන් ජනාධිපතිවරයා ය.

පාසැලේ උසස් අධ්‍යාපනය ලැබීමෙන් පසු ඊජිප්තුවේ මිලිටරි ඇකඩමියට බැඳුණු ඔහු මිලිටරි විද්‍යාව හදාරා උපාධිධාරියෙකු විය. අනතුරුව ගුවන් හමුදාවට බැඳී සටන් යාත්‍රා ගුවන් නියමුවෙකු ලෙස සේවය කළ අතර ඔහු ඒ අංශයෙන් තවත් උපාධි හිමිකරගත්තේය. සුසාන් මුබාරක් සහ විවාහ වූ ඔහුට අලා සහ ගමාල් යනුවෙන් පුතුන් දෙදෙනෙකි.

1972 - 1975 දක්වා මුබාරක් ඊජිප්තු ගුවන් හමුදාවේ අණ දෙන නිලධාරී තනතුර ඉසිලීය.

1975 දී එවකට ජනාධිපති අන්වාර් සදාත් විසින් හොස්නි මුබාරක් ඊජිප්තුවේ උප ජනාධිපති තනතුරට පත්කරන ලදී. සතුරුකම් අත්හරින්නටද, ප්‍රහාරයන් නවත්වන්නටද, දෙරට අතර මිත්‍රත්වයක් ඇතිකර ගැන්මට ද සදාත් ඊශ්‍රායෙලය සමග ගිවිසුමක් අත්සන් කළේ මේ වසරේදීය. සවුදි අරාබියාව ඇතුළු මැද පෙරදිග රටවල්ද කැමතිකරවා ගන්නට සදාත්ගේ දූතයා ලෙසින් සංචාරය කළේ මුබාරක් ය.

1981 දී ජනාධිපති සදාත් ඒ ඊශ්‍රායෙලය හා අත්සන් කළ ගිවිසුමට විරෝධය බොහෝ මුස්ලිම් කොටස් අතරින් මතුවූ අතර සදාත්ගේම හමුදා නිලධාරීහු පිරිසක්ද ඔහුට එරෙහි වූහ. එදින ඊජිප්තුවේ සූවස් ජයග්‍රහණය වාර්ෂිකව සමරණ උළෙලේ දී හමුදා ආචාර පෙළපාලි ඉදිරියේ එය පිළිගනිමින් සිටි ජනාධිපති සදාත්ට ඔහු පසුකර ගමන්ගත් හමුදා ට්‍රක් රථයක සිටි ඔහුට විරුද්ධ හමුදා භට කණ්ඩායමක් විසින් වෙඩි වරුසාවක්ම එල්ල කරන ලදී. වෙඩි වැදුණු සදාත් රෝහලේදී මියගියේය. ඒ ප්‍රහාරයේදී සදාත් අසළම සිටි මුබාරක් ඇතුළු බොහෝ දෙනෙක් ද බරපතළ ලෙස තුවාල ලැබූහ.

අන්වාර් සදාත්ගේ මරණයෙන් පසු ඊජිප්තුවේ ජනාධිපතිධූරයට පත් හොස්නි මුබාරක් ජාතික ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ ( National Democratic Party) සභාපතිවරයා ද විය. මෙතෙක් ඊජිප්තුවේ වැඩිම කාලයක් ජනාධිපතිධූරය හෙබවූ පුද්ගලයා ඔහුවන අතර ඒ කාලය වසර 29 ක් වෙයි.

මුබාරක්ට එරෙහිව නැගී ඇති චෝදනා අතර ප්‍රධාන වශයෙන් ඇත්තේ ඔහු සිය විරුද්ධවාදීන් නිර්දය ලෙස මර්දනය කිරීමය. ඒ බොහෝ දෙනා සිරකරනු ලැබ දරුණු වධ පමුණුවා මරාදමා ඇති බව කියති. මුබාරක්ගේ පාලනය නිසා මුස්ලිම් ලෝකය භේදභින්න වී සිටිති යන්න තවත් චෝදනාවකි. ඔහු තමාගෙන් පසු තම පුතා එතැනට ගේන්නට සිතා සිටින බවටද චෝදනාය. ඔහු ගුවන් හමුදාපති කාලයේ විවිධ ගණුදෙනු ඇසුරෙන් හා 1991 ගල්ෆ් යුද්ධය සමයේද ආයුධ ගණුදෙනු වලින් විශාල ධනස්කන්ධයක් උපයාගත් බවත් කියති. මුබාරක් සහ ඔහුගේ පවුලේ සාමාජිකයන් උපයා ඇති ධනය සහ වෙනත් වත්කම් ඩොලර් බිලියන 71 ටත් වඩා වැඩි බව ද පැවසේ..

♦ **චානක සිරිමාන්න**
**France**